ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
இலங்கை சட்ட உதவி ஆணைக்குழு
Legal Aid Commission of Sri Lanka

# කල් ඉකුත්වීමේ නීතිය

## (කාලාවරෝධය)



USAID/CORE ව්‍යාපෘතියේ ආධාර මත සකසන ලදී

USAID
FROM THE AMERICAN PEOPLE

USAID
FROM THE AMERICAN PEOPLE

## වගකීමෙන් මිදීමේ ප්‍රකාශය

"අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයේ (USAID) හරහා ලැබෙන ඇමරිකානු ජනතාවගේ පරිත්‍යාගශීලිත්වය මත මෙම ප්‍රකාශනය එළි දැක්වේ. මෙම වාර්තාවේ අන්තර්ගතය පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව සතුවන අතර එමඟින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයෙහි (USAID) හෝ ඇමෙරිකානු එක්සත් ජනපද රජයේ මතය කිසිඳු අයුරකින් පිළිබිඹු නොවන බව සැලකුව මැනව."

Ministry of Justice

# කල් ඉකුත්වීමේ නීතිය

(කාලාවරෝධය)

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

සම්පාදනය
නීතිඥ චූලාරි හෙට්ටිආරච්චි, LLB

*copyrights@ Legal Aid Commission of Sri Lanka*



## සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27)දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. වරප්‍රසාද නොලත් ප්‍රජාවන්ට නොමිලේ නීතිමය උපදෙස් ලබාදෙන අරමුණින් ව්‍යාවස්ථාපිත නීති ආයතනයක් ලෙස කොමිසම මානව හිමිකම්, ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, වැඩිහිටි අයිතිවාසිකම්, පවුල් නීතිය, කම්කරු නීතිය, වැනි ක්ෂේත්‍ර කිහිපයක නීතිමය සහය ලබාදෙයි. හැකිතාක් සිවිල් නීතියේ සහන සැලසීමට, දැනුවත් කිරීමට සහ මඟපෙන්වීම සඳහා අපගේ ආධාර පුළුල් කර ඇත්තෙමු.

අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බොහෝ සංවිධාන තිබුනත්, ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිමය කටයුතු කරගෙන යාමට නීතිමය බලය ඇති එකම ආයතනය නීති ආධාර කොමිෂන් සභාවයි.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ආදායම, සමාජ තත්වය, ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වයස නොසලකා උපදෙස් ලබා දෙයි. පීඩිත සහ අවදානමට ලක්ව ඇති දිවයින පුරා විසිරී සිටින දහස් ගණනකට නීතියේ පිහිට සමානව ලබාදීම ගැන අප ආඩම්බර වෙමු.

මෙම පොත් එකතුව ප්‍රජාවන්ට, නිලධාරින්ට සහ පුද්ගලයන්ට නීතිය අවබෝධ කර ගැනීමටත්, ඔවුන් ගේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව දැනුවත් වීමටත් අත්වැලක් වේ. තව දුරටත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ නිලධාරීන් මඟින් අවශ්‍ය නීතිමය සහය සහ උපදෙස් ලබා ගත හැකි බව දැනුවත් වීමට මෙය උපකාර වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**ජනාධිපති නීතිඥ රොහාන් සහබන්දු**
සභාපති, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27) දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. එමඟින් අවදානමට ලක් විය හැකි, අඟහිඟකම් ඇති ප්‍රජාවන්ට, සමාජ තත්වයෙන් හෝ ආර්ථික තත්වයෙන් හෝ ස්ත්‍රී පුරුෂ භාවය අනුව යුක්තිය සඳහා ප්‍රවේශ වීම සීමා වී ඇති පුද්ගලයින්ට නීති ආධාර සැපයීම උදෙසා පිහිටුවන ලද්දකි.

තිරසාරභාවය හා ස්ථාවරත්වය උදෙසා නීතිමය ආධාර සපයන වෙනත් ආයතන හා සංවිධාන අතරින් මෙම කොමිසන් සභාව ප්‍රමුඛස්ථානයක් ගනී.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව දිවයින පුරා පළාත් 9 ක මධ්‍යස්ථාන 84 පවත්වා ගෙනයන අතර දැනුවත් කිරීම සහ ආදායම් සීමාවකින් තොරව සියලුම දෙනාට නීති උපදෙස් සම්පාදන ලබා දීම පිළිබඳව අවබෝධ කිරීම් සිදුකරයි. එහි ස්ථිර නීතිඥයින් 120ට අධික සංඛ්‍යාවක් සහ නිදහස් වෘත්තීක නීතිඥයන් 1000 ට අධික සංඛ්‍යාවක් කාර්යයේ නිරත වේ.

''කොමිෂන් සභාවේ දැක්ම වන්නේ සියලුම ශ්‍රී ලාංකිකයන්ට යුක්තිය සඳහා සමාන ප්‍රවේශක් තිබිය යුතු සමාජයක් නිර්මාණය කිරීමයි.'' මෙම අරමුණ සාක්ෂාත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව බොහෝ ව්‍යාපෘති සිදුකර ඇත.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ මෙහෙවර වන්නේ රටේ නීතිමය පිහිට ලැබිය යුතු පුද්ගලයන්ට පිහිට ආධාර ලබාදීම බව පනතේ සඳහන් වේ.


# අපගේ දැක්ම

**යුක්තියට සම ප්‍රවේශයක්**

ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ ආර්ථික හෝ සමාජ තත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, කුලය, ආගම හෝ ජාතිකත්වය හෝ ආබාධිතභාවය නොසලකා යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් ඇති සමාජයක් නිර්මාණය කිරීමයි.

# පටුන


| | පිටු අංක |
|---|---|
| කල් ඉකුත්වීමේ නීතිය (කාලාවරෝධය) යනු කුමක් ද ? | 01 |
| ඉඩම් වලට අදාල කාලවරෝධි නීතිය | 02 |
| මුලික අයිතිවාසිකම් නඩු සම්බන්ධ කලාප ගමනය කෙසේද ? | 08 |
| මියගිය අයෙකුගේ අන්තිම කැමති පත්‍රය සම්බන්ධයෙන් කලාප ගමනය ? | 09 |
| අභියාචනාවන්ට අදාලු කාලාවරෝධි නීතිමය තත්වය කෙබඳු ද ? | 12 |
| LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන | 13 |




නීතිය නොදැනීම නිදහසට කරුණක් නොවේ, යන්න අප සියළුදෙනම දැන සිටිය යුතු මූලික සිද්ධාන්තයකි. එනම් නීතියේ පිළිසරණ පතන්නෙකුට තමන්ට අදාල නීතිය පිළිබඳ දැනීමක් නොතිබුණු බව නිදහසට කරුණක් ලෙස පැවසිය නොහැක.

## කල් ඉකුත්වීමේ නීතිය (කාලාවරෝධය) යනු කුමක් ද ?

ඒ අනුව මෙම කාලසීමා නීතිය පිළබඳව සාමාන්‍ය ජනතාව දැනුවත්ව සිටිම ඉතාමත් අවශ්‍යය කරුණක් වී ඇත. මන්ද නියමිත කාලසීමාවන් තුල අධිකරණයේ සහන අපේක්ෂා කල යුතු අවස්ථාවක එකී කාල සීමාව ඉකුත් වූ පසු එම කරුණ සම්බන්ධයෙන් පිලිසරණ පැතිය නොහැකි බැවිනි. මන්ද මෙහිදී යම් පුද්ගලයෙකුට තමන්ට අදාල කාල සීමා නිතිය පිළිබඳ දැනුමක් නොතිබුණු බව පැවස්මට නොහැකි නිසාය.

මෙහිදී අප සිහි තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ අධිකරණයේ පිහිට අපේක්ෂා කරන තැනැත්තෙකු හැකි ඉක්මණින් අධිකරණය වෙත යා යුතු බවයි.

> “අප්පමාදෝ අමත පදං-පමාදෝ මච්චුනෝ පදං” නැමැති බුදුවදන මෙහිදී අපට සිහිහපත් වේ. “ප්‍රමාදය පසුතැවීමට හේතුවකි.” මෙයද අප අතර පවතින ආප්තෝපදේශයකි.

නෛතිකව මෙම සිද්ධාන්තය “නීතිය විසින් උනන්දුවක් නැති පුද්ගලයන් නොව සුපරීක්ෂාකාරී පුද්ගලයන්ව රකිනු ලැබේ.” (Law helps the vigilant not the sleepy) ආදී වශයෙන් පැහැදිලි කර ඇත. අප දැන් මෙම නීතිමය සිද්ධාන්තය එක් එක් කේෂ්ත්‍රය කෙරෙහි අදාලවන ආකාරය සලකා බලමු.

# ඉඩම් වලට අදාල කාලවරෝධී නීතිය

අප සියළු දෙනාම දන්නා චිදිනෙදා අප සමාජයේ පුද්ගලයන් පවසන වදනක් වන්නේ "එයාට ඒ ඉඩම භුක්තියට අයිති වුනා" නැතහොත් මම දැන් මේ ඉඩමේ වසර ගණනාවක් ඉන්නේ මේක මට භුක්තියට අයිතිවෙලා තියෙන්නේ. මේ පිළිබඳව නීතිමය සිද්ධානත ගැඹුරින් සාකච්ඡා කිරිම මෙම කෘතියේ අරමුණ නොවන අතර, නමුත් සරලව මහජනතාවට වටහාගත හැකි අයුරින් එය පැහැදිලි කිරීමට අපේක්ෂා කරමි. මේ සම්බන්ධයෙන් කාලාවරෝධ ආඥා පනතේ 3 වැනි වගන්ති අදාල වේ. මෙම වගන්තියේ අදහස සරලව මෙසේ දැක්විය හැකිය.

කිසියම් ඉඩමක් එහි අයිතිය කියාපාන්නෙකුගේ අයිතියට එරෙහිව අඛණ්ඩව, ස්වාධීනව, ප්‍රතිවිරුද්ධ භුක්තිය වසර 10කට අධික කාලයක් දැරීමෙන් අයත් කරගත හැකි වන බවයි. නමුත් මෙම නීති තත්වය 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචිය වූ ඉඩමකට බලපාන්නේ නැත. කෙටියෙන් කිවහොත් කිසියම් ඉඩමක් හෝ නිශ්චල දේපලක් එහි අයිතිය කියාපාන්නෙකුගේ අයිතියට එරෙහි අඛන්ඩව ස්වාධීනව ප්‍රතිවිරුද්ධ භුක්තියෙන් වසර 10කට අධික කාලයක් දැරීමෙන් අයත්කර ගත හැකි වන බවයි. මෙම තුන්වන වගන්තියේ එන දස අවුරුදු අඛන්ඩ ප්‍රතිවිරුද්ධ ස්වාධීන භුක්තියේ අයිතිය සම්බන්ධ නිතිමය තත්වය කාලාවරෝධ පනතේ 13 වන වගන්තිය මඟින් සීමා කිරීමකට ලක්කර ඇති බව පෙනේ. එහි දැක්වෙන ආකාරයට අදාල භුක්තිය දරන්නේ යමෙකුගේ අයිතියට එරෙහිවද, ඒ අයිතිය ඇති තැන්ත්තා අදාල දස අවුරුදු කාලසීමාව තුල ළදරු භාවය, මන්දබුද්ධික භාවය, සිහිවිකල භාවය, උමතු භාවය හෝ විදේශගතවී සිටිම වැනි නොහැකියාවකින් පෙලුනේ නම් එවැනි විටෙක කාලාවරෝධ පනතේ 3 වගන්තියේ සඳහන් භුක්තිකරුවෙකුට එවැනි නොහැකියාවකින් පෙලෙන තැනැත්තෙකුට එරෙහිව අයිතිය නොලැබෙනු ඇත.



දස වසරකට වඩා අඛණ්ඩ බාධා රහිත භුක්තිය යන්න සලකා බැලීමේදී වැදගත් කරුණු කිහිපයක් වේ එනම්,

> කිසියම් භුක්තිකරුවෙකු විසින් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් දස වසරකට වැඩි අඛණ්ඩ නිර්බාධිත ස්වාධීන භුක්තිය තහවුරු කල යුත්තේ එම නිශ්චල දේපළ සඳහා හවුල් අයිතිකරුවෙකු නොවන පුද්ගලයෙකුට එරෙහිව යන්නය.

> එසේම පෙර සඳහන් කල 13 වගන්තියේ දැක්වෙන දුබලතාවයන්ට යටත් නොවන පුද්ගලයෙකුට එරෙහිව වීමද වැදගත් වේ.

කෙසේ වෙතත් මෙම කාලාවරෝධි හිමිකම යම් කිසි කුලී ගිවිසුමක්, බදු ගිවිසුමක් මත දේපළ භුක්ති විඳින්නෙකුට හෝ ඉඩම් හිමිකරුගේ අවසරය මත දේපළට පැමිණ සිටින තැනැත්තෙකුට තමා ඒ දේපළ වසර 10 කට වඩා කාලයක් භුක්ති වින්දේය යන පදනම මත අයිතිවාසිකම් කිව නොහැක.

මෙකී නීති තත්වය සම්බන්ධයෙන් මෑතකදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2016 අංක 05 දරණ කාලාවරෝධි (විශේෂ විධිවිධාන) පනත පිළිබඳ අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

එම පනතේ 2 (1) වගන්තිය අනුව.

මෙම පනතෙහි පූර්විකාවෙහි සඳහන් වන පරිදි 1983 මැයි මස 01 වන දිනයෙන් ආරම්භ වී 2009 මැයි මස 18 වන දිනෙන් අවසන් වන කාලසීමාව තුල යම් සටන්කාමී ත්‍රස්තවාදී කණ්ඩායකම ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ඇතැම් තැනැත්තන් අවාසි සහගත තත්ත්වයන්ට පත් වූ හෙයින් ද, එම නිසා අධිකරණයේ දී ඉඩම් ඇතුළු නිශ්චල දේපළක් ආපසු ලබා ගැනීම සඳහා සිය අයිතිවාසිකම් ක්‍රියාත්මක කර ගැනීමට එම තැනැත්තන්ට නොහැකි වූ හෙයින් ද, ඔවුන් වෙනුවෙන් විශේෂ නෛතික විධිවිධාන පැනවීමට කටයුතු කර ඇත.

ඉඩම් ඇතුළු යම් නිශ්චල දේපළක් ආපසු ලබා ගැනීම සඳහා නඩු පැවරීමට යම් තැනැත්තකුට අයිතිවාසිකම උපචිත වූ අවස්ථාවේ දී එම තැනැත්තා අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු වූයේ නම්, එසේ මුලින් සඳහන් කල තැනැත්තා අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු වූයේ නම්, එසේ මුලින් සඳහන් කල තැනැත්තා අවාසි සහගත තත්තවයට පත් වූ තැනැත්තකු වශයෙන් සිටිනතාක් දුරට, වෙනත් යම් තැනැත්තකු විසින් ඉඩම් ඇතුළු ඉහත කී නිශ්චල දේපළේ සන්තකයේ දැරීම මඟින්, එසේ සන්තකය දැරීම ප්‍රකාරව ඉඩම් ඇතුළු ඉහත කී නිශ්චල දේපළට (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥා පනතේ 3 වන වගන්තියේ දැක්වෙන යම් අයිතිවාසිකමක් එම තැනැත්තාට ලැබෙන බවට සලකනු නොලැබිය යුතුය.

මීළඟට වැදගත් කරුණක් වන්නේ භුක්තිගත නඩුකරයකට අදාලව කාලාවරෝධි නීති තත්වය කෙසේ බලපායිද යන්නය. කාලාවරෝධි ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව යම්කිසි නිශ්චල දේපළක භුක්තිය දරන්නෙකු එකී සන්තකය නිතියානුකූල නොවන ආකාරයෙන් බැහැර කරනු ලැබුවහොත් එසේ තමාගේ සන්තකය අහිමි කරනු ලැබූ තැනැත්තට එරෙහිව වසරක් ඇතුලත නඩුවක් පැවරිය හැකි බවය.

එසේම නඩු පැවරීමට පෙර එක් වසරක් ඇතුලත සන්තකය අහිමිකර ඇති බව ඔප්පු කිරීමෙන් පැමිණිලිකාරියට අයිතිය ඔප්පු කිරීමකින් තොරව එම සන්තකය ආපසු පැවරීම විත්තිකරුට එරෙහිව තීන්දු ප්‍රකාශයක් ලබා ගැනීමටද පුළුවන් වේ. කෙසේ වෙතත් එම පුද්ගලයාගේ සන්තකය අහිමිවී ඇත්තේ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක වීම නිසා නීතියානුකූල ආකාරයෙන් නම් ඉහත කී කාලාවරෝධ පනතේ 4 වැනි වගන්තියෙන් සහය ලබා ගත නොහැක.

කාලාවරෝධයට විෂය වූ දේපළ සම්බන්ධ නඩුවක් පැවරූ විට එකී දේපළේ දැනට පදිංචිව සිටින කාලාවරෝධයෙන් අයිතිය කියා සිටින පාර්ශවය සම්බන්ධව එකී කාලාවරෝධී කාලාසීම නඩුව පැවරූ දින සිට අත්හිටුවේ. කාලාවරෝධය ගණනය කිරීමේදී ඒ නඩුව පවතනි කාලය අත්හරිනු ලැබේ.

## හවුල් ඉඩමක කාලාවරෝධය

තිලකරත්න එදිරිව බැස්ටියන්, අල්විස් එදිරිව පෙරේරා, යන නඩුවලදී තහවුරු වූ නීතිමය සිද්ධාන්තයක් වන්නේ සැම හවුල් අයිතිකරු--වෙකුම හවුල් ඉඩමක සෙසු සියළුම හවුල් අයිතිකරුවන්ගේ නියෝජිතයෙකු ලෙස රැදී සිටින බවට හා එක් හවුල් අයිතිකරුවෙකු හවුල් ඉඩමක් භුක්ති විඳීමට සෙසු සියළුම හවුල් අයිතිකරුවන් වෙනුවෙන් සිදුකරන බවයි. මේ නිසා හවුල් අයිතිකරුවෙකු හවුල් ඉඩමක යම් නිශ්චිත කොටසක් වසර 10ට වැඩි කාලයක් භුක්තිවිඳීමෙන් කාලාවරෝධී හිමිකම ඉල්ලා සිටින්නේ නම් ඉහත කී නීතිමය පූර්ව නිගමනය බිඳහෙලීමට තරම් ප්‍රබල සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

යම් පාර්ශවයකට උරුමයෙන් හෝ පැවරීමෙන් නිශ්චල දේපළක් හෝ ඉඩමක් කෙරෙහි නොබෙදු අයිතිවාසිකමක් හිමිවූ විට එසේ හිමිවන නොබෙදු අයිතිය නීතියට අනුව අදාල දේපළේ නිශ්ත ප්‍රදේශයකින් හිමිවීමක් සිදු නොවන නිසා ඒ අයිතිය හවුල් අයිතිය ලෙස හැඳින්විය හැකිය. එහි සියළු හවුල්කරුවන්ට තමන්ට හිමි නොබෙදු අයිතියට ප්‍රමානුකූලව ඉඩමේ සම හතරැස් අඟලක් කෙරෙහිම ඉහත කී හවුල් අයිතිවාසිකම හිමිවනු ඇත.

එවැනි තත්වයක් ඔප්පුකල හැකි වන්නේ එසේ කාලාවරෝධී අයිතිය ඉල්ලා සිටින තැනැත්තා සෙසු හවුල් අයිතිකරුවනට අදාල නිශ්චිත ඉඩම් කොටසින් නෙරපා හැර හෝ බැහැර කර හෝ හවුල් අයිතියට ප්‍රතිවිරුද්ධ ප්‍රකට ක්‍රියාවක් සිදුකර එසේ සිදුකල දිනයේ සිට අඛන්ඩව නිරවුල්, සෙසු අයට හෝ අයිතිවාසිකම් වලට ප්‍රතිවිරුද්ධව ස්වාධීන භුක්තියක්, වසර 10 පුරා හෝ ඊට වැඩියෙන් දැරූබව තහවුරු කිරීමෙනි.

### පරවශතා හා කාලාවරෝධය

පරවශතා අයිතිය බොහෝ විට රඳා පවතින්නේ අන් අයෙකුගේ ඉඩමක් හෝ දේපළක් මතින් බව කිවහැකිය. මාර්ග අයිතිය, හිරු එළිය ලැබීමේ අයිතිය, වාත්‍රාශ්‍රය ලැබීමේ අයිතියි, ජලය ගලායෑම වැනි කරුණු පරවශතා අයිතිවාසිකම් ගණයට වැටේ. මේවැනි පරවශතා අයිතයක් ලැබීමට නම් අදාල පාර්ශවය විසින් එකී පරවශතා අයිතිය වසර 10කට වැඩි කලක් අඛණ්ඩ ප්‍රතිවිරුද්ධව හා ස්වාධීනව භුක්තිවිඳි බව ඔප්පු කල යුතුය.

## ඉඩමක් උකස් කිරීම හෝ බැඳුම්කරයක් මත තබා ඇති විටක කළ යුත්තේ කුමක්ද ?

මේ සම්බන්ධයෙන් කාලාවරෝධී ආඥා පනතේ 5 වන වගන්තිය අදාල වේ. එවැනි බැඳුම්කරයක්ම අයවිය යුතු එකී මුදල ලබා ගැනීම පිණිස වන නඩුවක් වසර 10ක් ඉකුත්වීමට පෙර පවරනු ලැබිය යුතුය. මෙම වසර 10ක කාලය ඇරඹෙන්නේ අදාල බැඳුම්කරයේ හෝ සාධක පත්‍රයේ එකී නියමිත මුදල ගෙවිය යුතු යම් නිශ්චිත දිනයක් සඳහන්ව ඇත්නම් ඒ දිනය ඉකුත්ව ගිය දින පටන්ය. එසේම එම බැඳුම්කරයේ කිසියම් කොන්දේසියක් කඩකිරීම හෝ ඒ හා බැඳුනු ගෙවිය යුතු පොලිය අවසන් වරට ගෙවූ දින සිට වසර 10ක් ඇතුලත ඒ සම්බන්ධව නඩුවක් නොපැවරුවේ නම් එය පවත්වගෙන යාමට නොහැකි බව 5 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් වේ.

## හවුල් ව්‍යාපාර ගිවිසුම්, පොරොන්දු නෝට්ටු, විනිමය බිල්පත් හෝ ලිඛිත පොරොන්දු ගිවිසුම්

මෙවැනි ආකාරයක වූ ලිඛිත ගිවිසුමක කොන්දේසි ක්‍රියාත්මක කරවා ගැනීමට අවශ්‍ය වන්නේ නම් එකී ගිවිසුමෙහි සඳහන් කොන්දේසි කඩකළ දින සිට වසර හයක් (06) ඇතුළත නඩුකරයක් පැවරිය යුතුය. විනිමය බිල්පතක් නම් එම ලේඛණය යටතේ අයවිය යුතු පොලිය අවසන් වරට ගෙවන ලද දිනයේ සිට වසර 06 ක් ඇතුළත නඩුකරයක් පැවරිය යුතුය.

<u>මීගමුව මහනගර සභාව එදිරිව බෙනඩික්ට් ප්‍රනාන්දු</u>

මෙම නඩුවේදී විදුලිබලය සැපයීමට අදාල ගාස්තු අයකර ගැනීමට අදාල බැඳීම ලිඛිත ගිවිසුමක්ද ණයක්ද යන්න ප්‍රශ්ණගත විය. අධිකරණය තීරණය කලේ එවැන්නක් ලිඛිත පොරොන්දුවක් වන අතර කාලාවරෝධය සම්බන්ධයෙන් ආඥා පනතේ 6 වන වගන්තිය අදාල වන බවයි. එමෙන්ම මෙහිදී සඳහන් කල යුතු තවත් වැදගත් කරුණක් වන්නේ විකිණීමේ ගිවිසුමක ඉතිරි ප්‍රතිශ්ඨා මුදල ලබා ගැනීම සඳහා පවරන නඩුවක කාලාවරෝධී කාල සීමාවද වසර 06 ක් බවයි. මේ බව <u>ළමාතැනී එදිරිව රනමන්ඩෝලේ</u> (26 NLR 406) නඩුවේදීද තීරණය වී ඇත.

## වාචික ගිවිසුමක් මත නඩුපැවරීමේ කාලසීමාව

මේ සම්බන්ධයෙන් කාලාවරෝධ ආඥා පනතේ 7 වගන්තිය අදාල වේ. මෙය බොහෝ විට චංචල දේපළක් සම්බන්ධයෙන් අදාල වන අතර බෙහෝවිට ලිඛිත ඇපකරයක් නැතිව දුන් ණය මුදලක් ආපසු ලබාගැනීම පිණිස පවරන නඩු මේ ගණයට අයත් වේ. ලිඛිතව ඇතිකර පොරොන්දුවක් හෝ ගිවිසුම් එකඟතාවයක් කඩකල විටකදී එම කොන්දේසි ඉටුකරවා ගැනීමට පවරන නඩුද මෙම වගන්තියෙන් ආවරණය වේ. මේ ආකාරයේ සියළුම නඩු වසර 03 ක් ඇතුළත පැවරිව යුතු අතර එසේ නැතහොත් එකී නඩු කාලාවරෝධී වේ.

මෙහිදී තෝමස් එදිරිව මුරුගේසු (1883/5 SSC 174) නඩුව ඉතා වැදගත් වේ.

මෙහිදී ප්‍රශ්නගත වුයේ 1879 වර්ෂයේදී ඉඩමක් කිසියම් ඔප්පුවක සඳහන් මූල්‍යමය ප්‍රතිශ්ඨාව ගැණුම්කරු විසින් විකුණුම්කරුට නොගෙවීමක් සම්බන්ධවයි. නඩුව පවරා තිබුනේ අදාල ඔප්පුව අත්සන් කර වසර 03 ක් ඉකුත්වීමෙන් අනතුරුවය. මෙහිදී අධිකරණය තීරණය කරන ලද්දේ පැමිණිලිකරුගේ නඩුව කාලාවරෝධ ආඥා පනතේ 7 වගන්තියට නොවැටුනත් මෙය සරල ණයක් ආපසු අයකරවා ගැනීම සඳහා කරන ලද නඩුවක් නිසා වසර 03ක් ඉකුක්වීමට පෙර පැවරිය යුතුය යන්නයි.

## විකුණන ලද භාණ්ඩයකට ලැබිය යුතු මුදල් ඉටුකරන ලද සේවයකට ලැබිය යුතු වේතනය ලබාගත හැක්කේ කෙසේද ?

මේ සම්බන්ධයෙන් කාලාවරෝධී ආඥා පනතේ 8 වන වගන්තිය අදාල වේ. එවැනි මුදලක් හෝ වේතනයක් ගෙවීමක් අය කර ගැනීමට නම් අදාල මුදල ලැබිය යුතු දින සිට වසරක් ඇතුළත නඩු පැවරිය යුතුය. එම කාල සීමව ඉකුත් වී පවරනු ලබන නඩු පවත්වාගෙන යා නොහැක.

ඉලංගකෝන් එදිරිව රණතුංග (1902)

මෙහිදී නඩු නිමිත්ත උද්ගත වූයේ කවදාද යන්න ප්‍රශ්ණගත විය. අධිකරණය තීරණය කලේ ප්‍රශ්නගත ණයට දුන් ඔරලෝසුව සම්බන්ධ නැවත ඉල්ලීම කල දින සිට නඩු නිමිත්ත උපචය වන බවත් කාලාවරෝධය ගණනය කල යුත්තේ එදින සිට බවත්ය.

## කිසියම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීමේදී

මේ සම්බන්ධයෙන් කාලාවරෝධී ආඥා පනතේ 9 වැනි වගන්තිය අදාල වේ. මෙම වගන්තිය යටතේ කිසියම් නඩුවක් අලාභයක් හෝ හානියක් සිදුවූ තැනැත්තෙකු ඒ නඩු නිමිත්ත උද්ගත වූ දින සිට වසර 02ක් ඇතුලත එකී අලාභ අයවකරවා ගැනීමට නඩු පැවරිය යුතුය.

උදාහරණයක් ලෙස දැක්වුවහොත් යම්කිසි තැනැත්තෙකු රිය අනතුරකට භාජනය වුවහොත් ඒ සම්බන්ධයෙන් වන සිවිල් නඩුකරය අනතුර සිදුවී වසර 2ක් ඉකුත්වීමට පෙර නිසි අධිකරණ බලය ඇති දිසා අධිකරණයක ගොනු කල යුතුය. මේ සම්බන්ධයෙන් අප සමාජයේ වෙසෙන බොහෝ දෙනා අතර පවතින සාවද්‍ය මතයක් වන්නේ එකී රිය අනතුර සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ පවතින නඩුකරය අවසන් වූ පසු පමණක් වන්දි ලබා ගැනීම සඳහා වන සිවිල් නඩකුරය පැවරිය යුතු බවය. නමුත් කාලාවරෝධී ආඥා පනතේ 9 වගන්තිය අනුව එවැනි වන්දි නඩුකරයක් නඩුකරයක් නඩු නිමිත්ත උද්ගතවූ දින සිට වසර 02ක් ඇතුලත පැවරීම අනිවාර්ය වේ.

## කාලාවරෝධ ආඥා පනතේ 10 වැනි වගන්තිය

මෙම ආඥා පනතේ 1 සිට 9 දක්වා වගන්තිවල විධිවිධාන සලස්වා නොමැති යම් නඩු නිමිත්තක් සම්බන්ධයෙන් හෝ කාලාවරෝධ ආඥා පනත අදාල නොවන අයුරින් යම් නඩු නිමිත්තක් ප්‍රකාශිතව බැහැර කර ඇති විටෙක එවැනි නඩු නිමිති ඒවා උද්ගත වී වසර 3ක් ඇතුලත පැවරිය යුතු බව දන්වා ඇත.

විලියම් එදිරිව බේකර් - (1888 SCC 165) නඩුවේදී තීරණයක වී ඇත්තේ නීතිවිරෝධි ලෙස දේප--ළක් අන්සතු කිරීමට එරෙහිව වන්දි නඩුවක් කාලාවරෝධ පනතේ 10 වැනි වගන්තියෙන් ආවරණය ලබන බවයි.

රත්නායක එදිරිව මේරි නෝනා - (54 NLR 197) තෑගි ඔප්පුවක් තෑගි දීමනාකරු විසින් අවලංගු කිරීමේ ඉල්ලීමක් සම්බන්ධව ප්‍රශ්නගත විය. මෙහිදී අදාල තෑගි දීමනාකරුට සහජාත දරුවෙකු උපන්නේය. මේ නිසා අදාල දේපළ එකී දරුවාට පැවරීම පිණිස පැරණි තෑගි ඔප්පුව අවලංගු කිරීමට තෑගි දීමනාකරු පැවැරූ නඩුව කාලාවරෝධයවීද යන්න අධිකරණය විමසා බලන ලදී. අධිකරණය තීරණය කලේ මෙය කාලාවරෝධ පනතේ 10 වන වගන්තියට යටත්වන අතර එසේ නම් අදාල නඩුනිමිත්ත සහජාත දරුවා ඉපදුණු වහාම පැණ නැගුනු බවය.

### හරස් හිමිකම් පෑම් හා හිලවු කිරීම් වලට අදාල නඩු

මේ සම්බන්ධයෙන් පනතේ 11 වගන්තිය අදාල වේ. යම් හරස් ඉල්ලීමක් හෝ හිලවු කිරීමක් සම්බන්ධව කරනු ලබන ඉල්ලීමක් හෝ නඩු පැවරීමක් මෙම ආඥා පනතේ ඉහතින් සඳහන් කෙරුණු වගන්තිවලට අනුව ඒ ඒ නඩු නිමිත්ත උපචය වූ දින සිට ඒ නියමිත කාලසීමාව තුල ඉදිරිපත් කල යුතුය. එසේ නොකලහොත් එකී නඩුව කාලාවරෝධි වනු ඇත.

## කාලවරෝධි පනතේ 12 වගන්තිය

"කාලවරෝධි ආඥා පනතේ 5,6,7,8,9,10 හා 11 වගන්තිවල සඳහන් නඩු නිමිති කාලවරෝධ වන කාලසීමාව බැහැර කල හැක්කේ ලිඛිතව සිදුකරනු ලබන ලියවිල්ලකින් පමණි."

Niblett vs Cooray (40 NLR 330) නඩුවේදී ණයක් පිළිබඳ පිළිගැනීම හා කාලාවරෝධි පනතෙන් ඉවත් වන බවට වන පිළිගැනීම ලිඛිතව තිබිය යුතු බවත් තීරණය වී ඇත.

### විවාහ නඩුකර හා රජයේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් කාලාවරෝධි බලපෑම් කෙසේද ?

මේ සම්බන්ධයෙන් 15 වන වගන්තිය අදාල වේ. එහි දැක්වෙන පරිදි කාලාවරෝධ ආඥා පනත රජයේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් හෝ දික්කසාද නඩුවක සම්බන්ධයෙන් බලපාන්නේ නැත.

# මූලික අයිතිවාසිකම් නඩු සම්බන්ධ කාලාපගමනය කෙසේද ?

1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වැනි පරිච්ඡේදයේ 10 සිට 14 දක්වා වූ ව්‍යවස්ථාවල මූලික අයිතිවාසිකම් පිළිබඳව දැක්වේ.

**10 වන ව්‍යවස්ථාව**

"සෑම තැනැත්තෙකුටම සිතීමේ නිදහස, හෘදසාක්ෂියේ නිදහස හා ආගමික නිදහස ඇත.

**11 වන ව්‍යවස්ථාව**

"වධහිංසා වලින් තොරව සිටීමේ නිදහස

**12 (1) 12 (2) වන ව්‍යවස්ථාව**

"නීතිය ඉදිරියේ සියළු දෙනාම සමානාත්මතාවයෙන් සැලකිය යුතු බව දක්වයි.

## 13 ව්‍යවස්ථාවේ දැක්වෙන අනුව්‍යවස්ථා 6 මඟින් පිළිවෙලින්

- නීතිවිරෝධී ලෙස කිසිවකු අත්අඩංගුවට නොගැනීම
- නීතිවිරෝධී ලෙස අත්අඩංගුවේ හෝ රඳවාගැනීමෙන් වැලකීම
- සධාරණ නඩු විභාගයට පෙනී සිටීමේ අයිතිය
- අධිකරණ නඩු විභාගයකින් තොරව කිසිම පුද්ගලයෙකු මරණ දණ්ඩනයට ලක්කිරීම හෝ බන්ධනාගාරගත නොකිරීම
- නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනය
- අතීතයට බලපාන දණ්ඩ නීති පැන්වීමෙන් වැලකීම යනාදී මූලික අයිතිවාසිකම් මීට ඇතුළත් වේ

මෙම ව්‍යවස්ථාවන් මඟින් දැක්වෙන මූලික අයිතිවාසිකම් කඩවූ අවස්ථාවක අදාල ඉල්ලීම අදාල කඩවීමෙන් හෝ ඊට ආසන්නතම හේතුව උද්ගතවීමෙන් මාසයක් ඇතුළත තමා විසින් හෝ නීතිඥවරයෙකු මාර්ගයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය පෙත්සමක් ඉදිරිපත් කළ යුතු බව 126 (2) ව්‍යවස්ථාවේ සඳහන් වේ.

# මියගිය අයෙකුගේ අන්තිම කැමති පත්‍රය සම්බන්ධයෙන් කලාපගමනය ?

මේ සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 516 වගන්තිය අදාල වේ. එහි දැක්වෙන පරිදි යම් තැනැත්තෙකු ශ්‍රී ලංකාවේ අන්තිම කැමති පත්‍රයක් තබා මියගිය අවස්ථාවක එය තබන ලද්දේ යම් තැනැත්තෙකුගේ ආරක්ෂාවේ ද ඒ තැනැත්තා විසින් හෝ අන්තිම කැමති පත්‍රය සොයාගත් තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රය සොයාගැනීමෙන් පසු මාස 03ක් ඇතුළත අධිකරණයට ඉදිරිපත් කළ යුතුය.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 527 වගන්තියේ අන්තිම කැමති පත්‍රයක් නොතබා රුපියල් ලක්ෂ පහකට වඩා වැඩි වටිනාකමක් ඇති දේපළක් තබා කිසිවකු මියගියහොත් එකී දේපළ අද්මිනිස්ත්‍රාසි කිරීම අනිවාර්ය බව දක්වා ඇත. ඒ සඳහා වන අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය බුදලය හිමි තැනැත්තාගේ මරණය සිදුවී මාස තුනක් ඇතුලත අධිකරණයක් වෙත ඉදිරිපත් කල යුතු බව දක්වා ඇත.

## සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ කල් ඉකුත්වීමේ නීතිය

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 22 වගන්තියට අනුව, සිවිල් නඩුවකට අදාල සියළු පාර්ශවකරුවන් එක් නොකිරීම හෝ සාවද්‍ය ලෙස එක්කර තිබීම සම්බන්ධයෙන් වන විරෝධතා හැකිතාක් ඉක්මණින් ඉදිරිපත් කළ යුතු අතර එම විරෝධය පෑම සියළු අවස්ථාවලදීම නඩු විභාගයට පෙර ඉදිරිපත් කළ යුතුය.

### සිවිල් නඩු විධාන සංග්‍රහයේ 84 වගන්තිය

විත්තිකරුට සිතාසි නියමිත පරිදි ලැබී ඇති බව අධිකරණය සෑහීමකට පත් වන විට ඔහුට උත්තරය ඉදිරිපත් කිරීමට නියමිතව ඇති දිනයේදී උත්තරය ඉදිරිපත් කිරීම හෝ පෙනී සිටීම පැහැර හැර ඇත්නම් ඒ නඩුව වහාම අධිකරණය විසින් ඒකපාක්ෂිකව විභාග කළ යුතුය.

### සිවිල් නඩු විධාන සංග්‍රහයේ 86 (2) වගන්තිය

විත්තිකරුගේ පැහැර හැරීම හේතු කොට ගෙන ඔහුට විරුද්ධව වාර්තාගත කරනු ලැබූ තීන්දු ප්‍රකාශය භාරදීමෙන් පසු දින 14ක් ඇතුළත එය පැහැර හැරීමට සාධාරණ හේතු තමාට තිබුණු බවට පැමිණිලිකරුට දැන්වීමක් සහිතව විත්තිකරු අධිකරණය සෑහීමකට පත්වන අයුරින් කරුණු දැක්වුවහොත් එම ඒකපාර්ශවික තීන්දුව අවලංගු කළ හැක.

**උත්තරවාද සංශෝධනයට අදාල කාලසීමාව**

සිවිල් නඩු විධාන සංග්‍රහයට 1991 අංක 9 දරණ සංශෝධනය මේ සම්බන්ධයෙන් වැදගත් වේ. ඒ අනුව 93 (1) වගන්තියෙන් දැක්වෙන්නේ නඩුව විභාග කිරීම හා පළමුවෙන් නියම කරන ලද දිනයට ප්‍රථම අධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් මත නඩුවේ සියළු පාර්ශවකරුවන්ට සාධාරණ කාලයක දැනුම්දීමකින් පසු නඩුවේ සියළුම උත්තරවාද ඒවාට යමක් එකතු කිරීමෙන් හෝ ඒවා වෙනස් කිරීමෙන් ඒවායේ යමක් අත්හැරීමක් හෝ ස්වකීය අභිමතය පරිදි සංශෝධනය කිරීමට අධිකරණයට බලය ඇති බවයි.

**සිවිල් නඩුවක සාක්ෂි ලැයිස්තුවට අදාල කාලාපගමනය**

මේ සම්බන්ධයෙන් අදාල වන්නේ සිවිල් නඩු සංග්‍රහයේ 121 (2) වගන්තිය හා 1995 අංක 14 දරණ සාක්ෂි විශේෂ ආඥා පනතේ 7 වගන්තියයි. 121 (2) වගන්තියට අනුව නඩුවක සෑම පාර්ශවකරුවකුම නඩුව විභාග කිරීමට නියම කරනු ලබන දිනයට දින 15 කට නොඅඩු දිනයකට පෙර විරුද්ධ පාර්ශවකරුට දැන්වීමක් කරනු ලැබීමෙන් පසු නඩු විභාගයේදී එම පාර්ශවකරු විසින් කැඳවනු ලබන සාක්ෂි කරුවන්ගේ හා ලේඛණවල ලැයිස්තුවක් අධිකරණයට ඉදිරිපත් කළ යුතුය.

මෙම නීති තත්වයට අදාලව 1995 අංක 14 දරණ සාක්ෂි විශේෂ විධිවිධාන පනතේ 7 වගන්තිය ප්‍රකාරව කිසියම් නඩුවකදී පටිගත කළ සාක්ෂි හෝ පරිගණක සාක්ෂි ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ සාක්ෂි ලැයිස්තුව නඩු විභාගයට දින 45 කට පෙර අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය.

**නිශ්චල දේපල විකිණීමට අදාල අධිකරණ තීන්දුවකට බලපාන කාලසීමා නීතිය**

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 282 සහ 283 වගන්ති මීට අදාල වේ. 282 (1) වගන්තියට අනුව තමා විසින් කරන ලද හෝ තම විධානය යටතේ කරන ලද නිශ්චල දේපළ පිළිබඳ සෑම විකිණීමක්ම එකී විකිණීම කිරීමෙන් පසු දින 10ක් ඇතුළත පිස්කල් විසින් අධිකරණය වෙත වාර්තා කළ යුතුය. තවද එබඳු විකිණීමක් එකී වාර්තාව ලැබීමෙන් පසු දින 30ක් ගත වන තුරු හා අධිකරණය විසින් ස්ථිර කරනු ලබන තුරු නියත නොවේ.

282 (2) වගන්තිය සඳහන් වන්නේ ඉහත කී පරිදි පිස්කල් වාර්තාව ලැබීමෙන් පසු දින 30ක් ඇතුළත එම විකිණීමට අදාලව යම් අක්‍රමිකතාවයක් ඇතැයි හැඟීයන හෙයින් අගතියට පත්වන නිශ්චල දේපළ හිමිකරුට පෙත්සමක් මඟින් අධිකරණයට කරුණු ඉදිරිපත් කළ හැක.

283 (1) වගන්තිය ප්‍රකාරව ඉහත කී ආකාරයේ අක්‍රමිකතාවයන් පිළිබඳ ඉල්ලීමක් අදාල දින සිට දින 30ක් ඇතුළත ඉදිරිපත් නොවුවහොත් විකිණීම ස්ථිර කිරීමේ ආඥාවක් නිකුත් කිරීමට අධිකරණය පියවර ගත යුතු බව දැක්වේ.

**නඩුවක් නතර කිරීමට අධිකරණය ආඥා කිරීමට අදාල කාලසීමාව**

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 402 වගන්තිය අනුව නඩුවක් පවත්වාගෙන යාමට පැමිණිලිකරු විසින් යම් පියවරක් ගැනීමට අවශ්‍යව තිබියදී ඔහු විසින් එම පියවර නොගෙන වාර්තාාවෙහි අන්තිම වරට ආඥාවක් හෝ නඩු කටයුත්තක් සටහන් කරනු ලැබූ දින සිට දිසා අධිකරණයක නම් මාස 6කට අධික කාලයක් ඉකුත් වුවහොත් නඩුව නතර කළ යුතු යැයි අධිකරණය විසින් අඥා කරනු ලැබිය හැකිය.

**රජයට එරෙහිව පවරන සිවිල් නඩුවල කාලාපගමනය**

මේ සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 461 වගන්තිය හා 461 (අ) වගන්තිය අදාල වේ. සිය නිල තත්වයෙන් කරනු ලැබුවේ යැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් රජය නියෝජනය කරන්නා වශයෙන් නීතිපතිවරයාට විරුද්ධ හෝ එවැනි ක්‍රියාවක් සම්බන්ධයෙන් රජය නියෝජනය කරන්නා වශයෙන් නීතිපතිවරයාට විරුද්ධව එවැනි ක්‍රියාවක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට හෝ පාර්ලිමේන්තු ලේකම්වරයෙකුට හෝ රජයේ නිළධාරියෙකුට හෝ විරුද්ධව කිසියම් නඩුවක් නඩු නිමිත්තද නඩුව පැවරීමට අදහස් කරන අයගේ නම හා වාසස්ථානයද ඔහු ඉල්ලා සිටින සහනයද සඳහන් ලිඛිත දැනුම්දීමක් අවස්ථානෝචිත පරිදි නීතිපතිවරයාට හෝ ඒ අමාත්‍යවරයාට පාර්ලිමේන්තු ලේකම්වරයාට හෝ රජයේ නිලධාරියා භාරදීමෙන් හෝ ඔහුගේ කාර්යාලයේ තැබීමෙන් පසු මාසයක් ගත වන තුරු පවරනු නොලැබිය යුතුය. තවද ඒ නඩුවේ පැමිණිල්ලෙහි එසේ දැනුම් දීමක් භාරදුන් බවට හෝ තැබූ බවට වූ ප්‍රකාශයක් ඇතුළත් විය යුතු බවද 461 වගන්තියේ දැක්වේ.

## විවාහයක් අවලංගු කිරීමේ තීන්දු ප්‍රකාශයක් නියත කිරීමට බලපාන කාලසීමා කුමක් ද ?

මේ සම්බන්ධයෙන් අදාල වන්නේ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 604 හා 605 වගන්තීන්ය. 604 වගන්තියට අනුව විවාහයක් අවලංගු කිරීම සඳහා වූ සෑම තීන්දු ප්‍රකාශයක්ම පළමුකොට ඒ තීන්දුව ප්‍රකාශයට පත්කළ තැනැත්තාටත් මාස 3කට නොඅඩු කාළයක් ඉකුත්වන තෙක් හෝ එකී තීන්දු ප්‍රකාශයෙන් අධිකරණය විසින් කරනු ලැබිය හැකි යම් දීර්ඝ කාළයක් ඉකුත් වන තෙක් හෝ නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් නොකළ යුතු යැයි නයිසයි තීන්දු ප්‍රකාශයක් විය යුතුය.

605 වගන්තියට අනුව නයිසයි තීන්දු ප්‍රකාශයක් කරනු ලැබූ අවස්ථාවක වූවද ඉහතින් අන්තිමට වූ වගන්තියේ සඳහන් පරිදි එහි සඳහන් කාලය ඇතුළත එය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් නොකළ යුතු වීමට කිසිම ප්‍රමාණවත් හේතුවක් දක්වා නොමැති විට එකී කාලය ඇතුලත එය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් නොකළ යුතු වීමට කිසිම ප්‍රමාණවත් හේතුවක් දක්වා නොමැතිවීම එකී කාලය ඉකුත්වීමෙන් පසු නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දුවක් බවට පත් කළ යුතු බවයි.

# අභියාචනාවන්ට අදාල කාලාවරෝධි නීතිමය තත්වය කෙබඳු ද ?


සිවිල් නඩුවට අභියාචනා කිරීමට අදාල ප්‍රතිපාදන සිවිල් නඩු විධාන සංග්‍රහයේ ඇතුලත් වේ. 2006 අංක 54 දරණ පළාත් බද මහාධිකරණ (විශේෂ විධිවිධාන සංශෝධන) පනත මඟින් පළාත්බද මහාධිකරණවලට සිවිල් අභියාචන හා ප්‍රතිශෝධන අධිකරණ බලය පවරා තිබේ.

මෙහිදී සිවිල් නඩු විධාන සංග්‍රහයේ 754 (4) වගන්තිය වැදගත් වේ. ඒ අනුව දිසා අධිකරණ තීන්දුවෙන් දින 14ක් ඇතුළත අදාල අභියාචන දැන්වීම මුල් අධිකරණයෙන්ම ගොනු කළ යුතුය.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 755 (3) වගන්තිය අනුව සෑම අභියාචකයෙකු විසින්ම ස්වකීය අභියාචන පෙත්සම නඩු තීන්දුවේ දිනයේ සිට දින 60ක් ඇතුළත මුල් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය.

- මහේස්ත්‍රාත් අධිකරණ තීන්දුවකින් අතෘප්තියට පත්වන යම් පාර්ශවකරුවෙකුට එකී තීන්දුවේ සිට දින 14ක් ඇතුළතදී ද නීතිපතිවරයා මාර්ගයෙන් නම් දින 28ක් ඇතුළතදීද මහාධිකරණය වෙතට අභියාචනා කළ යුතුය.
- කම්කරු විනිශ්චය සභාවල තීන්දුවකින් අතෘප්තියට පත්වන්නෙකුට නියෝගයේ දින සිට දින 30ක් ඇතුළතදී මහාධිකරණය වෙත අභියාචනා කළ යුතුය.
- ගෙවල් කුලී මණ්ඩලයේ සිට ගෙවල් කුලී සමාලෝචන මණ්ඩලය වෙත දින 21ක් ඇතුළත අභියාචනා කළ යුතුය.
- අභියාචනාධිකරණ අවසර ලබාගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයන් (CALA) අවසාන තීන්දුව දුන් විගසම වාචිකව අවසර ලබාගැනීම හෝ තීන්දුව දුන් සිට දින 21 ක් ඇතුළත එකී ඉල්ලීම සළකා බැලීම සඳහා අයැදීම කළ යුතුය.
- අභියාචනාධිකරණය විසින් දෙන ලද තීරණයක් හෝ පළාත්බද සිවිල් අභියාචානධිකරණය විසින් දෙන ලද තීන්දුවකට එරෙහි අදාළ තීන්දුව දුන් සිට සති 6ක් ඇතුළත (දින 42ක්) එකී ඉල්ලීම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය.

ඔබගේ පහසුව සඳහා අප නීති ආධාර මධ්‍යස්ථාන දක්වා ඇති අතර ළඟම පිහිටි මධ්‍යස්ථානයට ගොස් ඔබට අවශ්‍ය නීතිමය උපදෙස් ලබාගැනීමට කටයුතු කළ හැක.



# LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන

| | |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | 011-2433618 |
| අක්කරෙයිපත්තු | 067-2279462 |
| අම්පාර | 063-2223495 |
| අනුරාධපුර | 025-2224465 |
| අත්තනගල්ල | 033-2297020 |
| අවිස්සාවේල්ල | 036-2233857 |
| බද්දේගම | 091-2292051 |
| බදුල්ල | 055-2225759 |
| බලංගොඩ | 045-2289099 |
| බලපිටිය | 091-2255753 |
| බණ්ඩාරවෙල | 057-2224733 |
| බත්තරමුල්ල | 011-2877687 |
| මඩකලපුව | 065-2225399 |
| චාවකච්චේරිය | 021-2270882 |
| හලාවත | 032-2222175 |
| දඹුල්ල | 066-2284551 |
| දෙයියන්දර | 041-2268077 |
| දෙනියාය | 041-2271128 |
| ඇඹිලිපිටිය | 047-2230299 |
| ගල්ගමුව | 037-2253290 |
| ගාල්ල | 091-2226124 |
| ගම්පහ | 033-2248804 |
| හම්බන්තොට | 047-2221092 |
| හැටන් | 051-2222390 |
| හිඟුරක්ගොඩ | 027-2245521 |
| හෝමාගම | 011-2748813 |
| හොරණ | 034-2265244 |
| යාපනය | 021-2224545 |
| කඩවත | 011-2922440 |
| කඩුවෙල | 011-2548150 |
| කැකිරාව | 025-2263536 |
| කල්මුනේ | 067-2223710 |
| කළුතර | 034-2222017 |
| මහනුවර | 081-2388978 |
| කන්තලේ | 026-2234521 |
| කැබිතිගොල්ලෑව | 025-2298101 |
| කෑගල්ල | 035-2231790 |
| කිලිනොච්චි | 021-2285618 |
| කුලියාපිටිය | 037-2284611 |
| කුරුණෑගල | 037-2229641 |
| මහියංගනය | 055-2258332 |
| මාහෝ | 037-2275075 |
| මන්නාරම | 023-2222045 |
| මාරවිල | 032-2254443 |
| මාතලේ | 066-2224828 |
| මාතර | 041-2233815 |
| මතුගම | 034-2249262 |
| මාවනැල්ල | 035-2247272 |
| මීනුවන්ගොඩ | 011-2297790 |
| මොණරාගල | 055-2276891 |
| ගල්කිස්ස | 011-2718708 |
| මුලතිවු | 021-2290077 |
| මුයිතූර් | 026-2238777 |
| නාවලපිටිය | 054-2224227 |
| මීගමුව | 031-2281080 |
| නිකවැරටිය | 037-2260203 |
| නුගේගොඩ | 011-2809068 |
| නුවරඑළිය | 052-2235260 |
| පානදුර | 038-2244822 |
| පේදුරුතුඩුව | 021-2260212 |
| පොල්ගහවෙල | 037-2243039 |
| පොළොන්නරුව | 027-2226572 |
| පොතුවිල් | 063-2248485 |
| පුගොඩ | 011-2405333 |
| රත්නපුර | 045-2226899 |
| තංගල්ල | 047-2240122 |
| තඹුත්තේගම | 025-2276259 |
| තිස්සමහාරාමය | 047-2239611 |
| ත්‍රිකුණාමලය | 026-2226328 |
| වාලච්චේනයි | 065-2258349 |
| වව්නියාව | 024-2221863 |
| වලස්මුල්ල | 047-2245566 |
| වැල්ලවාය | 055-2274466 |
| වරකාපොළ | 037-2277075 |
| වාරියපොල | 037-2268199 |
| වැලිමඩ | 057-2244860 |
| මල්ලකම් | 021-2059170 |
| පුත්තලම් | 032-2266636 |
| සියඹලාණ්ඩුව | 055-2279250 |
| දෙහිඅත්තකණ්ඩිය | 027-2250700 |
| LT-බොරැල්ල | 011-2698003 |
| ගලගෙදර | 081-2061025 |
| වත්තල | 011-2935907 |
| හෙට්ටිපොල | 037-2291915 |

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

නො.129, මහාධිකරණ සංකීර්ණය,
හල්ෆ්ට්ස්ඩෝර්ප් වීදිය, කොළඹ 12.

011 2433618

legalaidcommission1978@gmail.com

www.legalaid.gov.lk